**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබූ මෙම වාර්ථාවේ 1.6.1.(අ) (i) ඡේදයේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 8 ක පැවති පාසල් 39 ක් වසා දමා වර්ෂ 5 ක සිට වර්ෂ 24 ක් අතර කාල පරාසයක් ගතවී තිබුණද එම පාසල් නිසි පරිදි පවරා ගෙන ,මායිම් සලකුණු කර පාසැලට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | ඉඩම් ඵලදායී ප්‍රයෝජනයන් සඳහා යොදා ඇති බව හා වත්කම් පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම් පවරා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කර වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කළ යුතුය. |
| (ii) | භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ , යන්ත්‍ර උපකරණ ආරම්භක ශේෂය රු.596,258,867 ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙතින් ලබා ගත් තොරතුරු අනුව ආරම්භක ශේෂය රු.594,712,012 ක් වූයෙන් රු.1,546,855 ක වෙනසක් නිරීක්‍ෂණය විය. | ආරම්භක ශේෂයට කරන ලද ගැලපීම්ද, ආරම්භක ශේෂය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමේදී ආරම්භක ශේෂයටම එකතු කර දැක්වීමද මෙම වෙනසට හේතු වන බව. | වෙනසට හේතු හඳුනාගෙන ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 1409 වැය විෂය සඳහා 2023 වර්ෂයට අදාල ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය රු.80,000,000 ක් වූ අතර 318 පරිපූරක අයවැය මඟින්ද රු.1,200,000 ක ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණි. ඒ අනුව ලද රු.81,200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.67,167,588 ක් පමණක් වැයකර රු.14,032,412 ක් ඉතිරි වී තිබුණු බැවින් පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කර ගත් ප්‍රතිපාදනයටත් වැඩි ප්‍රතිපාදනයක් ඉතිරි වී තිබුණි. | ඉදිකරමින් පවතින ගාල්ල දිස්ත්‍රික් ශ්‍රවණාගාරයේ ආරක්ෂක සේවා සපයා ගැනීම සඳහා පරිපූරක ප්‍රතිපාදන වෙන් කරවා ගනු ලැබූවද ආරක්ෂක සේවා සපයා ගැනීමට නොහැකි වීම මත මෙම ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරිවී ඇති බව. | අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන ප්‍රතිපාදන වෙන්කර ගත යුතුය. |
| (ආ) | 2005 වර්ෂයේදී නිලධාරිනියක් විසින් කරන ලද භාෂා දීමනා ඉල්ලීම රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යංශ නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ විසින් ප්‍රතික්ෂේප කර තිබියදී 2024 මාර්තු විගණන අවස්ථාව වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් එම නිලධාරිනියට භාෂා දීමනා රු.133,605 ක් ගෙවා තිබුණි. 1998 දෙසැම්බර් 30 දිනැති අංක 29/98 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව හා ආයතන | 2012 වසරේදි නිලධාරිනිය කරන ලද ඉල්ලීමට අනුව නිලධාරිනිය හදාරා ඇති ඉංග්‍රීසි විෂය උපාධි පාඨමාලාවේ ප්‍රධාන විෂයක් බවට විශ්ව විද්‍යාලයෙන් තහවුරු කර ගැනීමෙන් අනතුරුව මෙම දීමනාව නිලධාරිනියට ගෙවා ඇති බව කාරුණිකව සඳහන් කරමි.<br><br>විගණන නිරීක්ෂණයෙන් අනතුරුව මෙම භාෂා දීමනාව ගෙවීම සම්බන්ධයෙන් නැවතත් ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙතින් විමසීම් කර ඇති අතර එම උපදෙස් ලද පසු ඒ අනුව ක්‍රියාකර විගණනය දැනුවත් කිරීමට කටයුතු කරන | 2005 වර්ෂයේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යංශයේ නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂ විසින් අදාල ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබියදී ගෙවීම කිරීම නිවැරදි නොවන බැවින් ඒ සම්බන්ධයෙන්සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කර අවශ්‍ය පැහැදිලි කිරීම් ලබා ගැනීමකින් තොරව අතිරේක දිස්ත්‍රික් ලේකම් විසින් මෙම ගෙවීම අනුමත කර තිබුණි. | බව කාරුණිකව දන්වමි | |

**2.**2 **තැන්පතු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 22ට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට රු.211,731,887 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමෙහි ඇති රු.10,000,000 මුදල විශේෂ කාර්යයක් සඳහා ලද පරිත්‍යාගයක් බව හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල පොදු තැන්පතු ශේෂයන් විවිධ හේතුන් මත නිදහස් කිරීමට නොහැකි වී ඇති බව. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| විදේශ රැකියා අමාත්‍යාංශයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට අනුයුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරි අනුව බල ප්‍රදේශයේ විගමනික පවුල් හා විදේශ රටවල සේවය කර පැමිණි ශ්‍රමිකයන් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම, විගමනික පවුල් සඳහා පවුල් පසුබිම් වාර්තා ,සමාජ වාර්තා පවත්වාගෙන යෑම | මෙම අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතින බව | නිලධාරීන් වෙත පැවරී ඇති රාජකාරී නිසි පරිදි ඉටු කළ යුතුය. |

අවදානම් පවුල් සඳහා සංවර්ධන සැලසුම් සැකසීම, විගමනික පවුල්වල දරුවන්ගේ සුබසාධන කටයුතු අඛණ්ඩව සුපරික්ෂණය හා උපදේශනය කල යුතුය. නමුත් වදුරඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් එම කටයුතු ඉටු වී නොතිබුනු අතර ප්‍රමාණවත් අධීක්ෂණයක් ද සිදු කර නොතිබුණි.

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.9,943,748 ක් වැය කර තෝරාගත් ප්‍රතිලාභින් 323 දෙනෙකු හා එක් සෞභාග්‍යා නිෂ්පාදන සමිතියක් වෙත අගය එකතු කළ කුරුඳු නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා උපකරණ ලබා දී තිබුණි. 2023 සැප්තැම්බර් 08 දින සිදු කරන ලද ක්ෂේත්‍ර විගණන පරීක්ෂණයේදී සෞභාග්‍යා නිෂ්පාදන සමිතිය වෙත ලබා දී තිබූ රු.1,360,000 ක් වටිනා උපකරණ නිෂ්කාර්යව තිබුණු අතර රු.164,900 ක් වටිනා උපකරණ ප්‍රයෝජනයට නොගෙන ඇසුරුම් තුලම තිබුණි. ප්‍රතිලාභින් 6 දෙනෙකුට රු.597,000 ක් වටිනා කුරුඳු ඇඹරුම් යන්ත්‍ර ලබා දී තිබුණද ව්‍යාපෘතිය තුලින් අපේක්ෂා කළ කුරුඳු නිෂ්පාදන වෙළඳපළට එකතු කර | සෞභාග්‍යා නිෂ්පාදන සමිතිය වෙත ලබා දි තිබූ උපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ පවතින බවත්, අවශ්‍ය අවස්ථාවලදී උපකරණ වල ආරක්ෂාව සඳහා ඇසුරුම් වල බහා තබන බවත් දන්වා ඇත. ප්‍රතිලාභින් 06 දෙනාට ලබා දුන් කුරුඳු ඇඹරුම් යන්ත්‍ර මඟින් නිෂ්පාදන කටයුතු බාධාවකින් තොරව සිදු කරන බවත් රටෙහි පැවති අයහපත් ආර්ථික පසුබැම තුළ මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි වේගවත් සංවර්ධනයක් කරා යොමු කර ගැනීමට නොහැකි වූ බව සහ සාර්ථක ව්‍යාවසායකයින් 15කට අධික ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතිය තුළින් බිහිවී ඇති බව. | ව්‍යාපෘති සම්බන්ධයෙන් පසු විපරම් අඛණ්ඩව සිදුකරමින් ප්‍රයෝජනයට නොගත් උපකරණ හා නිශ්කාර්යව පැවති උපකරණ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන ඵලදායීව ප්‍රයෝජනයට යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. | | |
| (ආ) | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මාළු ආශ්‍රිතව අගය වැඩි දියුණු කරන ලද නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 50 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.5,070,995 ක් වටිනා උපකරණ නිෂ්කාර්යව තිබුණි. රු.20,190 ක් වටිනා උපකරණ ප්‍රයෝජනයට නොගෙන ඇසුරුම් තුළම තිබූ අතර ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කළ අරමුණු ඉටු වී නොතිබුණි. | විගණනයේදී පෙන්වා දී ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කර එවැනි තත්වයන් තව දුරටත් සිදු නොවීමට වගබලා ගන්නා බව. | උපකරණ ඵලදායීව ප්‍රයෝජනයට ගත හැකි වැඩපිළිවෙලක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | බද්දේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්යන්ත්‍ර පේෂ කර්ම නිෂ්පාදන ව්‍යාපෘතියන් සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 20 දෙනෙකු වෙත රු.4,642,471 ක් ද, රසකැවිලි හා කිරි නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා තෝරාගත් ප්‍රතිලාභින් 25 දෙනෙකු වෙත රු.368,416 ක් වැයකර උපකරණ ලබා දි තිබුණි. 2023 නොවැම්බර් 16 විගණන පරීක්ෂාවට අනුව ප්‍රතිලාභින් 11 දෙනෙකු හා සෞභාග්‍යා අත්යන්ත්‍ර පේෂකර්ම ගොඩනැගිල්ල සඳහා ලබා දී තිබූ රු.845,265 ක් වටිනා උපකරණ ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කළ මට්ටමින් නිෂ්පාදන කටයුතු වල නොයෙදවීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි . | කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අපහසුතා හේතුවෙන් නිෂ්පාදන කටයුතු හා බෙදා හැරීමේ කටයුතු සිදු කිරිමට නොහැකි වූ බව හා ඉදිරියේදී නිෂ්පාදනය වැඩි කිරිමට හා අලෙවි කිරිමට ක්‍රියා මාර්ග ගන්නා බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් අඛණ්ඩව සිදු කරමින් බෙදා දුන් උපකරණ කාර්යක්ෂමව භාවිතා කරමින් ඒ තුළින් උපරිම ප්‍රයෝජන ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදි ක්‍රියාත්මක සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ විගණනයට භාජනය කල ප්‍රාදේශිය ලේකම් කාර්යාල 10 ක ප්‍රතිලාභින් 1,250 ක් සඳහා රු 39,630,093 ක් වැය කර භාණ්ඩ හා උපකරණ බෙදා දී තිබුණද ඉන් ප්‍රතිලාභීන් 726 ක් සමාලෝචිත වර්ෂයේදී ද අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම මත තව දුරටත් සමෘද්ධි සහනාධාර ගෙවමින් පැවතුණි. | ව්‍යාපෘති තුලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම මත අපේක්ෂිත අරමුණු ඉටු වි නොතිබූ බැවින් තවදුරටත් සමෘද්ධි සහනාධාර ගෙවන බව. | පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදු කරමින් අදාල ප්‍රතිලාභීන් ව්‍යාපෘති වෙත යොමු කිරීමත්, ඔවුන්ට පවතින ගැටළු නිරාකරණය කර ගැනීමට උපකාරී වීමත් කළ යුතුය. |
| (ආ) | වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 39 දෙනෙකු වෙත ගල් කැටයම් හා කළුගල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා උපකරණ හා වැඩබිම් සකස් කිරීම සඳහා උපකරණ ලබාදීම වෙනුවෙන් රු.3,790,838 ක් වැය කර තිබුණි. ප්‍රතිලාභින් 16 දෙනෙකුගේ නියැදියකින් පරීක්ෂණ අවස්ථාව වන විට ප්‍රතිලාභීන් 07 ක් සඳහා ලබාදුන් රු.234,300 ක් වටිනා වැඩබිම් සකස් කිරීමේ උපකරණ හා එක් ප්‍රතිලාභියෙකු වෙත ලබාදුන් රු.35,040 ක් වටිනා අනෙකුත් උපකරණද භෞතිකව නිරීක්ෂණය නොවුණි. | පැවති ආර්ථික අර්බුදය හමුවේ මෙම කර්මාන්තය අඩාලවී පැවති බවත් මේ වන විට එම උපකරණ භාවිතයට ගනිමින් කටයුතු කරන බව හා භෞතිකව නිරික්ෂණය නොවූ උපකරණ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව | සංවර්ධන ව්‍යාපෘති තෝරාගැනීමේදී ඵලදායී ව්‍යාපෘති තෝරා ගැනීමටත්, භෞතිකව නිරීක්ෂණය නොවූ උපකරණ වලට වගකිව යුතු ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් ක්‍රියා කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2020 යටතේ පින්නදූව පටුමගේ 4 වන අතුරු මාර්ගයේ මධ්‍යයේ ඇති විදූලි කණු මාර්ගයේ පසෙකටකර පැති කාණු ගොඩනැංවීමේ ව්‍යාපෘතිය සඳහා රු.600,000 ක ඇස්තමේන්තු ගත මුදලකට ගිවිසුම් ගතවී තිබුණි. ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදූ කල කොන්ක්‍රීට් ඝණක සාම්පල් 8 න් සාම්පල් 6ක්ම අවශ්‍ය සම්පීඩක ශක්තිය නොතිබුණු අතර රුහුණු විශ්ව විද්‍යාලය මගින් පරීක්ෂාවන් සිදූ කල කොන්ක්‍රීට් ඝණක සාම්පල් 3කම අවශ්‍ය සම්පීඩන ශක්තියෙන් තොරව තිබියදි රු.496,959 ක්වූ බිල්පත් වටිනාකමින් රු.383,375ක් 2020 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. | කර්මාන්තයේ කොන්ක්‍රිට් වටිනාකමින් සියයට 50ක රැඳවුම් මුදල් තබා ගෙන ගෙවීම් කර ඇති බව. | කොන්ක්‍රිට් සාම්පල් අවශ්‍ය සම්පිණ්ඩණ ශක්තියෙන් තොරවන විටදී ප්‍රතිශත වශයෙන් ගෙවීම් නොකර විධිමත් ප්‍රමිතියෙන් කර්මාන්තය ඉටු කර ගත යුතුය. |
| (ආ) | ගෝනාපීනුවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ නිවාඩු දින වැටුප් ගෙවීමේදී ආයතන සංග්‍රහයේ viii වන පරිච්ඡේදයේ 10 වෙනි වගන්තිය ප්‍රකාරව වැඩකල කාලය පැය 8කට නොඅඩු බව සනාථ කර ගැනීමකින් තොරව බහුමානතා සහතිකයක් පදනම් කරගනිමින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් රු.178,648 ක්ද ගමන් වියදම් රු.127,140 ක්ද ගෙවා තිබුණි. | නිලධාරින්ට නිවාඩු දින වැටුප් ගෙවීමේදී කළ වැඩසටහන හා ධාවන සටහන් අනුව රාජකාරි කාලය සනාථ කරගන්නා බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම සහ වැඩ කළ කාලය තහවුරු කරගෙන නිවාඩු දින වැටුප් ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | බදු අනුමැතිය ලබා ගැනීම සඳහා බදුකරුවන් 36 දෙනෙකුට අදාල ලිපි ගොනු හික්කඩුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර විගණිත දිනය වු 2023 සැප්තැම්බර් 21 දින වන විට වරෂ 1 සිට වර්ෂ 6 ක් දක්වා කාල පරාසයක් ඉක්ම ගොස් තිබුණද බදු අනුමැතිය ලැබී නොතිබුණි.තවද ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021 ඔක්තෝම්බර් 22 දිනැති අංක 2021/06 දරණ චක්‍රලේඛය ප්‍රකාරව දළ තක්සේරුවක් පදනම් කර ගනිමින් නියමිත ප්‍රතිශතයන්ට අනුව වාර්ෂික බදු මුදල් ගණනය කර නොතිබුණි. | බදුකරුවන් දෙදෙනෙකු සම්බන්ධයෙන් බදු අනුමත ලිපි ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර ඉතිරි බදුකරුවන් 34 දෙනා සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත සිහි කැඳවීමේ ලිපියක් යොමු කර ඇති බව. | කඩිනමින් බදු මුදල් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | රත්ගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීමේදී රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රු.250,000 කට මාසික තක්සේරු කුලිය ලබා දී තිබියදී ඒ පිළිබඳව නොසලකා හැර ප්‍රාදේශිය ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් විසින් ලබා දුන් කුලී වටිනාකම පදනම් කර ගනිමින් මාසික කුලිය රු.325,000 බැගින් වසර 4 ක් සඳහා කුලියට ගැනිමට ගිවිසුම් ගත වී තිබුණි. | රජයේ තක්සේරු වටිනාකමට ගොඩනැගිල්ල ලබා දිමට නොහැකි බැවින් ස්වාධින කමිටුවක් පත් කර බදු කුලිය නැවත තක්සේරු කොට අදාල ගොඩනැගිල්ල බදු ගත් බව දන්වා තිබුණි. මේ ලෙසටම බදුකරු සමඟ පැවති අන්‍යෝන්‍ය එකඟතාවය මත පැරණි ගොඩනැගිල්ලෙහි ඉවත් කරන ලද බෙදා වෙන් කිරීම් නව ගොඩනැගිල්ලෙහි ගබඩා කරන ලද බව. | රජයේ තක්සේරුව හෙලිදරව් නොකර මෙම කටයුත්ත සිදු කළ බව විගණනයේදී නිරීක්ෂණය වු බැවින් මේ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | අම්බලන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද එක් ගමකට එක් ව්‍යවසායකයකු බිහි කිරිමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභින් 23 දෙනෙකු වෙනුවෙන් රු.1,545,798 ක රජයේ දායකත්වයක් දරා තිබුණි. ප්‍රතිලාභින් 6 ක් වෙත ලබා දුන් රු.348,000 ක් වටිනා විජලන යන්ත්‍රවල විජලන ධාරිතාව සීමා වීම, විදුලි බල පරිභෝජන වියදම ඉහළ යාම හා තරඟකාරි | ව්‍යවසායකයන්ගේ අවශ්‍යතාවය හා ධාරිතාවය අනුව මෙම යන්ත්‍රෝපකරණ ලබා දුන්නද විදුලි බිල වියදම ඉහළ යාම බලපාන ලද බවත් මේ වන විට විවිධ ක්‍රියාකාරකම් හරහා ව්‍යවසායකයන් දිරිගන්වන බවත්. | ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගේ ගැටළු හඳුනාගෙන ඒ සඳහා පිළියම් යෙදිය යුතුය. |

නිෂ්පාදකයින්ට සාපේක්ෂව පිරිවැය ඉහළ යාම හේතුවෙන් ව්‍යාපාරික කටයුත්තක් ලෙස යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සපයා ඇති තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විට විවිධ තනතුරුවල පුරප්පාඩු 11 ක් ද අතිරික්තතා 114 ක් ද පැවතුණි. | පුරප්පාඩු සහ අතිරික්තතා පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු පුරවා ගැනීමටත් අතිරික්තය අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |